ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

# පුරප්පාඩු - ව්‍යාපෘති කාර්ය මණ්ඩලය

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය විසින් කළමණාකරණ චක්‍රලේඛ අංක 01/2016 පරිදි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල සංවර්ධන ව්‍යාපෘතිය - අදියර (2) පියවර II

පුරප්පාඩු තනතුරු - රියදුරු

පුරප්පාඩු සංඛ්‍යාව - 02

<u>අධ්‍යාපන සුදුසුකම්</u>

1. අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල/ දෙමළ භාෂාව ඇතුළුව සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත්ව තිබීම.

<u>වෘත්තීය සුදුසුකම්</u>

1. පෞද්ගලික/ කුලී රථ සහ තාර බර හොණ්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. බඳවා ගන්නා දිනට වසර තුනකට (03) පෙර අවම වශයෙන් සී සහ සී 1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රයක් අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය.)
2. මහා මාර්ග නීති සම්බන්ධව මනා දැනුමක් තිබිය යුතුය.

<u>පළපුරුද්ද</u>

වාහන රියදුරකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)

<u>කායික සුදුසුකම්</u>

1. අවම උස අඩි 5 ක් විය යුතුය.
2. දිවා කාලයේදී හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස මනා ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද විධිමත් සහතිකයක් මගින් ඒ බව සනාථ කළ යුතුය.

<u>වෙනත් සුදුසුකම්</u>

1. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
3. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

<u>වයස</u>

| | | |
|---|---|---|
| අවම සීමාව | - | අවුරුදු 18 ට නොඅඩු |
| උපරිම සීමාව | - | අවුරුදු 45 ට නොවැඩි |

වැටුප් පරාශය

2016-03-24 දින දරණ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අංක 01/2016 දරණ කළමණාකරණ සේවා චක්‍රලේඛයෙහි විධිවිධාන ප්‍රකාර රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

පොදු කොන්දේසි

සේවකයාගේ අර්ථ සාධක අරමුදල් (EPF) දායකත්වය 8% වන අතර සේවා යෝජකයාගේ අර්ථ සාධක අරමුදල් (EPF) දායකත්වය 12% සහ භාරකාර අරමුදල් (ETF) දායකත්වය 3% වශයෙන් මාසික වැටුපෙන් අඩුවනු ඇත.

රැකියා නියමයන් හා කොන්දේසි

පත්වීම් මූලික වශයෙන් එක් (01) වසරක් සඳහා කොන්ත්‍රාත් පදනම මත වන අතර ව්‍යාපෘතියේ කාලසීමාව සහ සතුටුදායක කාර්ය සාධනය මත පදනම්ව දීර්ඝ කිරීමේ හැකියාවද පවතී.

අයදුම්පත්

අයදුම්කරුවන් විසින් සිය ජීව දත්ත තොරතුරු ප්‍රකාශය (CV) අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම් සඳහන් කරමින් ඥාතීන් නොවන නිර්දේශිකයින් (02) දෙදෙනෙකුත් විමසුම් විස්තරද සමඟ පහත සඳහන් ලිපිනයට 2017.10.24 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්කරුවන්ට තම අයදුම්පත පුද්ගලිකවද පහත සඳහන් අමාත්‍යාංශ කාර්යාලයට පැමිණ අතින් භාර දිය හැකිය. අයදුම්කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිළිව සටහන් කරනු මැනවි. රාජ්‍ය/ අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. අයදුම්පත් එවිය යුතු ලිපිනය

ලේකම්
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
සෙත්සිරිපාය අදියර II ,07 මහල
බත්තරමුල්ල